සැ. යු. - මෙවර පළවන *ගැසට් පත්‍රයේ* VI කොටසේ 2021 වර්ෂය සඳහා කොළඹ දිස්ත්‍රික්කයට අයත් අධිකරණ කලාපවල ජූරි සභිකයින්ගේ නාමාවලියක් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන්ගෙන් පළ වේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,242 - 2021 අගෝස්තු මස 20 වැනි සිකුරාදා - 2021.08.20**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

# II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)

| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම ... ... ... | — |
| මුදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | 504 |

සැ. යු. - (i) ආගාමික හා විගාමික (සංශෝධන) පනත් කෙටුම්පත 2021 ජුලි මස 30 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

(ii) යූඑන්වී පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2021 ජුලි මස 30 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාලවේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2021 සැප්තැම්බර් මස 10 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2021 අගෝස්තු 27 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපැලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

**"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැළකිය යුතු ය."**

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2021 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය www.documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

503- B 082260 — 353 (2021/08)
D 1 -

# විවිධ දැන්වීම්

## ගණන් බේරා වසා දැමීම පිළිබඳ දැන්වීම

ස්වකීය සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරමින් කොළඹ දී පවත්වනු ලබන බස්නාහිර පළාතේ පළාත්බද මහාධිකරණයේ දී ය

*නඩු අංකය* : 33/2020/CO
*ස්වභාවය* : ගණන් බේරා වසා දැමීම

2007 අංක 07 දරන සමාගම් පනතේ XII වන පරිච්ඡේදය ප්‍රකාරව ඊට යටත්ව අධිකරණය විසින් ගණන් බේරා වසා දැමීම සඳහා කරනු ලබන ඉල්ලීමක් පිළිබඳ කාරණාවයි.

ඒ. ටී. එල්. ඩිජිටල් ඉනොවේටිස් (පුද්ගලික) සමාගම,
අංක 2/1,
ඇතුළත බගතලේ පාර,
කොළඹ 03.

.....................*පෙත්සම්කරු.*

සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් කොළඹ දී පැවැත්වෙනු ලබන බස්නාහිර පළාතේ මහාධිකරණය විසින් ඉහත නම සඳහන් සමාගම ගණන් බේරා වසා දමනු ලැබීම සඳහා අංක 2/1, ඇතුළත බගතලේ පාර, කොළඹ 03, ලිපිනයේ පිහිටා ඇති ඒ. ටී. එල්. ඩිජිටල් ඉනොවේටිස් (පුද්ගලික) සමාගම විසින් 2020 ක් වූ ඔක්තෝබර් මස 05 වන දින එකී අධිකරණයට පෙත්සමක් ඉදිරිපත් කරනු ලැබූ බවත්, එකී පෙත්සම 2021 ක් වූ සැප්තැම්බර් මස 02 වන දින අධිකරණය ඉදිරියේ විමසීම සඳහා නියම කරනු ලැබූ බවත්, එකී පෙත්සම සම්බන්ධව නියෝගයක් නියම කිරීම සඳහා සහය දීමට හෝ ඊට විරුද්ධ වීමට කැමැත්තක් දක්වන එකී සමාගමේ කවර හෝ ණය හිමියෙකුට හෝ දායකයෙකුට එම අරමුණ වෙනුවෙන් එකී විමසීම කරන අවස්ථාවේ පුද්ගලිකව හෝ සිය නීතිඥවරුන් මගින් පෙනී සිටිය හැකි බවත්, පෙත්සමේ පිටපතක් අවශ්‍ය සමාගමේ කවර හෝ ණය හිමියෙකුට හෝ දායකයෙකුට නියමිත ගාස්තු ගෙවීම මත, පහත අත්සන් කරනු ලබන අය විසින් එය සපයනු ලබන බවත් මෙයින් නිවේදනය කරනු ලැබේ.

*අත්සන් කළේ* : ෂංදීප ගමඇතිගේ, නීතිඥ,
අංක 222/5, කොටා පාර, කොළඹ 08

*සටහන* : එකී පෙත්සම සම්බන්ධ විමසීමේ දී පෙනී සිටීමට අදහස් කරන කවර හෝ පුද්ගලයෙකු එසේ කිරීමට ඇති සිය අදහස ඉහත නම සඳහන් ෂංදීප ගමඇතිගේ නීතිඥ මහතුන්ට ලිඛිතව දන්වා භාර දිය යුතුය. *නැතහොත්*, තැපෑලෙන් එවිය යුතුය. දැනුම් දීම කරන පුද්ගලයාගේ නම හා ලිපිනය ද, සමාගමක් නම් සමාගමේ නම හා ලිපිනය දැන්වීමේ ප්‍රකාශ කළ යුතු අතර පුද්ගලයා හෝ සමාගම විසින් හෝ ඔහුගේ හෝ ඔවුන්ගේ (නීතිඥවරයෙක් සිටී නම්) නීතිඥවරයා/වරිය විසින් අත්සන් කළ යුතු අතර, 2021 ක් වූ සැප්තැම්බර් මස 01 වන දින පස්වරු 6.00 ට පෙර භාරදිය යුතුය. *නැතහොත්* තැපැල් මගින් එවන්නේ නම්, ප්‍රමාණවත් කාලය තුළ (ඉහත නම සඳහන් නීතිඥවරයාට) ඔවුන්ට ලැබෙන ලෙසට තැපැල් මගින් එවිය යුතුය.

08-269

---

## ශ්‍රී ලංකා චිත්ත මනෝවිද්‍යා උසස් අධ්‍යාපන විවෘත විද්‍යායතනය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

බුද්ධික පතිරණ වන මම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ අංක 53 (1) දරන ස්ථාවර නියෝගය යටතේ "ශ්‍රී ලංකා චිත්ත මනෝවිද්‍යා උසස් අධ්‍යාපන විවෘත විද්‍යායතනය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි'', යනුවෙන් හැඳින්වෙන පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවේදී ඉදිරිපත් කිරීමට අදහස් කරන බව මෙයින් දැනුම් දෙමි.

පනත් කෙටුම්පතේ අරමුණු වනුයේ පහත සඳහන් පොදු පරමාර්ථ වලින් යුක්ත වන්නා වූ එකී පදනම සංස්ථාගත කිරීමයි :-

*(අ)* මනෝ උපදේශකවරුන් සඳහා නිසි සංවිධානයක් ලබා දීම ;
*(ආ)* මනෝවිද්‍යා අධ්‍යයනයන් ප්‍රවර්ධනය කිරීම හා සංවර්ධනය කිරීම සහ මනෝ උපදේශකවරුන්ගේ ප්‍රමිතීන් පිහිටුවීම සහ නිකුත් කිරීම ;
*(ඇ)* රටේ පුරවැසියන්ගේ උද්ගතව ඇති නොයෙක් මානසික සෞඛ්‍ය ප්‍රශ්න නිරාකරණය කර ඔවුන්ගේ මානසික සෞඛ්‍ය සුහදයී කරලීමට අවශ්‍ය මනෝ උපදේශක/උපදේශිකාවන් රට තුළ ස්ථාපිත කිරීම ;

යනාදිය වේ.

බුද්ධික පතිරණ,
පාර්ලිමේන්තු මන්ත්‍රී.

08-378

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.